# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය

සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு

சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance

State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/05/SDO/EB/2020 | ඔබේ අංකය / உமது இல / Your No: ............................................ | දිනය / திகதி / Date: 2021.01.08 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පැවැත්වෙන I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කර ඇති මගේ සමාංක හා **2020.12.04, 2020.12.10, 2020.12.21, 2020.12.24, 2021.01.05** හා **2021.01.07** දිනැති කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 නිවේදන වලට අමතර වශයෙනි.

02. ඒ අනුව, අදාළ විභාග පැවැත්වීමේ කටයුතු මේ වන විට සැළසුම් කරමින් පවතින අතර, විභාගය පැවැත්වීම දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කිරීමේ සියළු වගකීම් ඔබ වෙත පවරමි. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

2.1. මේ වන විට ඔබ දිස්ත්‍රික්කයේ විභාග අපේක්ෂකයින්ගේ අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙමින් පවතින අතර, රටේ වර්තමානයේ පවතින තත්ත්වය මත තැපැලෙහි යම් ප්‍රමාදයක් තිබෙන බව නිරීක්ෂණය කරමි. ඔබ වෙත එවන ලද මාගේ 2020.01.07 දිනැති ලිපියෙහි 4 වන ඡේදයේ දක්වා ඇති පරිදි ඔබ දිස්ත්‍රික්කයේ විභාගයට පෙනීසිටීමට නියමිත නිලධාරීන්ගේ සමස්ථ නාම ලේඛනය කඩිනමින් මා වෙත ලබාදීමට කටයුතු කරන්න. (අදාළ විභාග මධ්‍යස්ථානයේ නම ද සමඟ)

2.2. විභාග අපේක්ෂකයින් සංඛ්‍යාවට අනුව, ප්‍රවාහන පහසුකම් සහිත ප්‍රධාන නගරය ආසන්නයේ විභාග මධ්‍යස්ථානයක් සඳහා සුදුසු ස්ථානයක් වෙන්කරවා ගැනීම.

2.3. විභාග ශාලාධිපතිවරුන් හා විභාග නිරීක්ෂකවරුන් ලෙස ඒ සඳහා සුදුසු නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කිරීම. (අවශ්‍යතාවය අනුව සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන් / සමෘද්ධි කළමනාකරුවන් / අදාළ පාසලේ ගුරුභවතුන් / වෙනත් රජයේ නිලධාරීන් මේ සඳහා යොදාගත හැක.) එක් විභාග මධ්‍යස්ථානයක් සඳහා එක් ශාලාධිපතිවරයෙක් හා විභාග අපේක්ෂකයින් 50 කට එක් විභාග නිරීක්ෂක වරයෙක් යොදාගැනීම ප්‍රමාණවත් යැයි සළකමි. එම නිලධාරීන්ගේ නම, තනතුර, සේවය කරනු ලබන ආයතනය, ජා.හැ.අංකය හා ජංගම දූරකථන අංකය සහිත ලේඛනයක් කඩිනමින් මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

2.4. විභාග පැවැත්වෙන දින ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය විභාග ප්‍රශ්ණපත්‍ර, පිළිතුරු සැපයීමේ කඩදාසි හා වෙනත් රාජකාරි ලිපි ලේඛන එදිනට ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් මඟින් ඔබ වෙත ලබා දීමට කටයුතු කෙරේ. පිළිතුරුපත්‍ර නැවත සුරක්ෂිතව ප්‍රධාන කාර්යාල වෙත ගෙන ඒමේ වගකීම එම අධීක්ෂණ හා සම්බන්ධීකරණ කටයුතු පවරනු ලබන ප්‍රධාන කාර්යාලයේ නිලධාරියා වෙත පැවරේ.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

2.5. විභාග අපේක්ෂිකයන්ගේ විභාග ප්‍රවේශ පත්‍රය ඔබ වෙත ලබාදීමට කටයුතු කරන අතර, එය අදාළ නිලධාරින් වෙත සුරක්ෂිතව ලබාදීමේ වගකීම ඔබ වෙත පවරමි.

2.6. ඒ අනුව, ඔබ දිස්ත්‍රික්කයේ විභාගය පැවැත්වීමේ කටයුතු සඳහා දැරීමට සිදුවන වියදම් ඇස්තමේන්තුව සකස්කර 2021.01.13 දින වන විට මා වෙත එවීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි. (විද්‍යුත් තැපැල මගින්)

03. දැනට ප්‍රධාන කාර්යාලය වෙත **<u>ලැබී ඇති අයදුම්පත්‍ර අනුව</u>** අදාළ අපේක්ෂකයින්ගේ නාම ලේඛනය 2021.01.10 දින සවස දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලබන බැවින් එහි නම් සඳහන්ව නොමැති අපේක්ෂකයෙක්වේ නම් ඔවුන්ගේ අයදුම්පත් ද විද්‍යුත් තැපැල මගින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට වෙත 2021.01.11 දින වන විට යොමු කිරීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. (විද්‍යුත් තැපැල් ලිපිනය - adsamurdhi2014@gmail.com)

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

01. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස. හා අ.ක.ස.